OL/2010/87-S-I-II

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

87 S I,II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

| | | |
|---|---|---|
| සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I, II | | පැය තුනයි |
| தொடர்பாடல், ஊடகக் கல்வி I, II | | மூன்று மணித்தியாலம் |
| Communication & Media Studies I, II | | Three hours |

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I

සැලකිය යුතුයි :

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

1. සන්නිවේදනයේ දී ග්‍රාහකස්ථානය
(1) තනි පුද්ගලයෙකි.
(2) තනි පුද්ගලයෙක් හෝ කණ්ඩායමකි.
(3) කණ්ඩායමක් හෝ ආයතනයකි.
(4) තනි පුද්ගලයෙක්, කණ්ඩායමක් හෝ ආයතනයකි.

2. නිර්වාචික සන්නිවේදනය ඉතා ප්‍රබල ලෙස හා කලාත්මක ලෙස භාවිත කළ හැකි ජනමාධ්‍යයක් වන්නේ
(1) පුවත්පතයි.
(2) රූපවාහිනියයි.
(3) සිනමාවයි.
(4) අන්තර්ජාලයයි.

3. ෂැනොන් හා වීවර් සන්නිවේදන ආකෘතියට අනුව සිතුවිලි පණිවිඩයක් බවට පරිවර්තනය වන්නේ
(1) විකාශන අවස්ථාවේ දී ය.
(2) පණිවිඩ ප්‍රතිග්‍රහණයේ දී ය.
(3) ආකේතකරණ අවස්ථාවේ දී ය.
(4) විකේතකරණ අවස්ථාවේ දී ය.

4. ගුවන්විදුලි සන්නිවේදකයෙක් භාවිත කරන ප්‍රධානතම සන්නිවේදන ස්වරූපය කුමක් ද?
(1) වාචික සන්නිවේදනය
(2) භාෂාත්මක සන්නිවේදනය
(3) ශ්‍රව්‍ය සන්නිවේදනය
(4) සංකේතාත්මක සන්නිවේදනය

5. එක්තරා ප්‍රාදේශීය සුපිරි වෙළඳසැලකට සිය නව සේවාවන් පිළිබඳ ව පාරිභෝගික ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය වේ. මේ සඳහා වඩාත් සුදුසු වන්නේ
(1) පෝස්ටර් හා අත් පත්‍රිකා ය.
(2) අත් පත්‍රිකා හා පුවත්පත් දැන්වීම් ය.
(3) පුවත්පත් හා ගුවන්විදුලි දැන්වීම් ය.
(4) ගුවන්විදුලි හා රූපවාහිනී දැන්වීම් ය.

6. 'නිරවද්‍ය ප්‍රවෘත්තියක් ඉදිරිපත් කිරීමේ දී වාර්තාකරුවා හා මූලාශ්‍රය අතර සබඳතාව ඉතා වැදගත් වේ.' මේ ප්‍රකාශයට අනුව ප්‍රබල ප්‍රවෘත්ති මූලාශ්‍රයක් වන්නේ
(1) ප්‍රවෘත්ති නිවේදන ය.
(2) දේශන හා රැස්වීම් ය.
(3) නිල වාර්තා ය.
(4) ප්‍රවෘත්ති සාකච්ඡා ය.

7. ඔබ පවත්වන දේශනයකට අදාළ සටහන් සහ වගු රැසක් ඔබේ ග්‍රාහකයාට ඉදිරිපත් කිරීම සඳහා අවම පිරිවැයකින් ඔබට භාවිත කළ හැකි උපකරණය කුමක් ද?
(1) වර්ණ විනිවිදක ප්‍රක්ෂේපණ යන්ත්‍රය (slide projector)
(2) උඩිස් ප්‍රක්ෂේපණ යන්ත්‍රය (OHP)
(3) ශ්වේත පුවරුව (white board)
(4) බහුවිධ ප්‍රක්ෂේපණ යන්ත්‍රය (multi-media projector)

8. පේජරය වර්තමානයේ දී භාවිතයෙන් ගිලිහී යමින් පවතින තොරතුරු හුවමාරු උපකරණයකි. එසේ වීමට බලපාන ප්‍රධාන හේතුවක් වන්නේ
(1) එය මිල අධික වීමයි.
(2) ජංගම දුරකථනයේ ව්‍යාප්තියයි.
(3) අන්තර්ජාලයේ ව්‍යාප්තියයි.
(4) භාවිතයේ ඇති අපහසුවයි.

[ දෙවැනි පිටුව බලන්න.

9. වර්තමානයේ තැපැල මගින් පෞද්ගලික ලිපි හුවමාරු වීම ඉතා පහළ මට්ටමක පවතින බව ප්‍රවෘත්තියක පළ විය. ඒ සඳහා බොහෝ දුරට හේතු විය හැක්කේ
   (1) විද්‍යුත් තැපැල භාවිතය වැඩි වීමයි. (2) ලිපි ලිවීමට ජනතාවට කාලය නැති වීමයි.
   (3) දුරකථන භාවිතය ඉතා ඉහළ යාමයි. (4) SMS හෙවත් කෙටි පණිවුඩ යැවීමට හැකි වීමයි.

10. පොත් මුද්‍රණය කිරීමේ දී ඇතුළත පිටු සඳහා භාවිත කෙරෙන කඩදාසිවලට වඩා ඝනකම වැඩි කඩදාසි වර්ග පොත් කවර සඳහා භාවිත කෙරේ. ඊට ප්‍රධාන හේතුව කුමක් ද?
   (1) මනා ආරක්ෂාවක් ලබා ගත හැකි වීම (2) ආකර්ෂණීය පෙනුමක් ලබා ගත හැකි වීම
   (3) පහසුවෙන් භාවිත කළ හැකි වීම (4) වර්ණ හතරක කවරයක් මුද්‍රණය කළ හැකි වීම

11. පුවත්පතකට විදේශ ප්‍රවෘත්ති ලබා ගැනීමේ වඩාත් විශ්වසනීය මූලාශ්‍රය වන්නේ
   (1) අන්තර්ජාල වෙබ් අඩවි භාවිතයයි.
   (2) විදෙස් පුවත් සේවා භාවිතයයි.
   (3) අන්තර් මහද්වීපික රූපවාහිනී සේවා භාවිතයයි.
   (4) තානාපති කාර්යාල තොරතුරු භාවිතයයි.

12. ඓතිහාසික කතාවස්තුවක් සහිත චිත්‍රපටයක එක් රූප රාමුවක නවීන අත්ඔරලෝසුවක් පැලඳි නළුවෙක් රංගනයේ යෙදී සිටිනු දර්ශනය විය. මෙවැනි නොගැළපෙන දර්ශනයක් සම්බන්ධයෙන් වගකිව යුත්තේ
   (1) පිටපත් රචකයා ය. (2) අධ්‍යක්ෂවරයා ය.
   (3) කලා අධ්‍යක්ෂවරයා ය. (4) නිෂ්පාදකයා ය.

13. විද්‍යුත් ජනමාධ්‍ය මගින් ප්‍රචාරය කෙරෙන දැන්වීමක ගාස්තුව තීරණය කිරීමට **බලනොපාන්නේ**
   (1) එය ඉදිරිපත් කරන අවස්ථාව හා වේලාවයි. (2) ඒ සඳහා ගනු ලබන කාලයයි.
   (3) එකී දැන්වීමේ අන්තර්ගතයයි. (4) එම නාලිකාවේ ව්‍යාප්තියයි.

14. රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදන ක්‍රියාවලියේ අනුපිළිවෙළ කුමක් ද?
   (1) නිෂ්පාදනය, පසු නිෂ්පාදනය, සංස්කරණය
   (2) පිටපත් රචනය, නිෂ්පාදනය, සංස්කරණය
   (3) පෙර නිෂ්පාදනය, නිෂ්පාදනය, පසු නිෂ්පාදනය
   (4) පිටපත් රචනය, පෙර නිෂ්පාදනය, නිෂ්පාදනය

15. ජාත්‍යන්තර සමුළුවක සියලු තොරතුරු ඓතිහාසික මූලාශ්‍රයක් ලෙස සංරක්ෂණය කළ යුතු බවට තීරණය විය. ඒ සඳහා යොදගත හැකි වඩාත් යෝග්‍ය ක්‍රමවේදය වනුයේ, ඒ ඇසුරෙන්
   (1) වාර්තාමය චිත්‍රපටයක් සකස් කිරීමයි.
   (2) රූපවාහිනී ප්‍රවෘත්ති වාර්තාවක් සකස් කිරීමයි.
   (3) කෙටි චිත්‍රපටයක් නිර්මාණය කිරීමයි.
   (4) පුවත්පත් අතිරේකයක් පළ කිරීමයි.

16. සාර්ථක ප්‍රවෘත්ති ඡායාරූපයක ප්‍රධානතම අවශ්‍යතාවක් වන්නේ
   (1) වචන ඉක්මවා යන ලෙස තොරතුරු රැසක් ඉදිරිපත් කිරීමයි.
   (2) ප්‍රවෘත්තියට අදාළ සිදුවීම වඩාත් පැහැදිලිව ඉදිරිපත් කිරීමයි.
   (3) අදාළ සිදුවීම සහ ස්ථානය හඳුනාගත හැකි පරිදි ඉදිරිපත් කිරීමයි.
   (4) ඡායාරූපය සිත්ගන්නාසුලු සහ පැහැදිලි ලෙස ඉදිරිපත් කිරීමයි.

17. ගුවන් විදුලි වැඩසටහන් නිෂ්පාදකයකුගේ ප්‍රධාන භූමිකාව වන්නේ
   (1) වැඩසටහන් සෑදීමට අරමුදල් යෙදවීමයි.
   (2) වැඩසටහනේ තාක්ෂණික කටයුතු මෙහෙයවීමයි.
   (3) වැඩසටහන පිළිබඳ සමස්ත වගකීම දැරීමයි.
   (4) වැඩසටහන ඉදිරිපත් කිරීමයි.

18. පරිකල්පනය වඩාත් ප්‍රබල ලෙස යොද ගත හැකි ජනමාධ්‍ය කුමක් ද?
   (1) පුවත්පත (2) ගුවන්විදුලිය (3) රූපවාහිනිය (4) අන්තර්ජාලය

19. මුද්‍රණ කඩදාසි පිළිබඳ අසත්‍ය ප්‍රකාශය කුමක් ද?
   (1) GSM අගය යනු කඩදාසියක වර්ගමීටරයක බරයි.
   (2) සියලු ම සුදු මුද්‍රණ කඩදාසි එක ම බරකින් යුක්ත ය.
   (3) ඩිමයි 1/8 යනු එම කඩදාසියේ 1/8 ක ප්‍රමාණයයි.
   (4) කඩදාසියක ඝනකම නිර්ණය කරන්නේ එහි GSM අගය මත ය.

[ තුන්වැනි පිටුව බලන්න.

20. කෙටි කාලයක් තුළ වැඩි පිටපත් ප්‍රමාණයක් ලබා ගැනීම සහ උසස් මුද්‍රණ ප්‍රමිතියක් පවත්වා ගැනීම සඳහා සුදුසු ම මුද්‍රණ තාක්ෂණය කුමක් ද?
    (1) ඩිජිටල් මුද්‍රණය (digital printing)    (2) උත්තල මුද්‍රණය (letter press printing)
    (3) ලිතෝ මුද්‍රණය (litho printing)    (4) සමතල මුද්‍රණය (offset printing)

21. ඈත අතීතයේ ටෙලිග්‍රාෆ් ක්‍රමය මගින් පුවත් හුවමාරුව සිදු කිරීමේ දී ඇති වූ බාධක ජය ගැනීමට 'ආවෘත පිරමීඩාකාර වාර්තාකරණය' මුලින් ම යොදගත් බව කියැ වේ. ප්‍රවෘත්ති වාර්තාකරණයේ දී තවමත් භාවිත කෙරෙන මෙම ක්‍රමයේ මූලික ලක්ෂණය වනුයේ
    (1) ප්‍රවෘත්ති වාර්තාව පිළිබඳ ග්‍රාහක ආකර්ෂණය උපරිම තලයට ගෙන එමින් අදළ වැදගත් තොරතුරු වාර්තාව අවසානයෙහි ඉදිරිපත් කිරීමයි.
    (2) ප්‍රවෘත්ති වාර්තාව හා සම්බන්ධ සියලු වැදගත් තොරතුරු ප්‍රවෘත්ති වාර්තාව ආරම්භයේ දී ම ග්‍රාහකයා වෙත ලබා දීමයි.
    (3) මුල සිට අග දක්වා ග්‍රාහක අවධානය යොමු කර ගැනීමේ අරමුණින් අදළ වැදගත් තොරතුරු සෑම ඡේදයක ම ඇතුළත් කිරීමයි.
    (4) සිද්ධියට අදළ තොරතුරු පිරමීඩාකාර ක්‍රමයට මුල සිට අග දක්වා අනුපිළිවෙළින් ග්‍රාහකයා වෙත වාර්තා කිරීමයි.

22. පාසලේ පුස්තකාලය පරිහරණය කිරීමේ රටාව අධ්‍යයනය කිරීම සඳහා වඩාත් සුදුසු දත්ත එක්රැස් කිරීමේ ක්‍රමය කුමක් ද?
    (1) ප්‍රශ්නාවලියක් යොද ගැනීම    (2) නිරීක්ෂණය මගින් තොරතුරු රැස් කිරීම
    (3) සම්මුඛ සාකච්ඡා පැවැත්වීම    (4) පුස්තකාලයාධිපතිගෙන් තොරතුරු දනගැනීම

23. සන්නිවේදනය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත සඳහන් වේ.
    A - කල්පනාකාරීව, ප්‍රවේශමෙන් පණිවිඩය සකස් කිරීම මගින් බොහෝ 'අර්ථ බාධක' වළක්වා ගත හැකි ය.
    B - සන්නිවේදනයේ ප්‍රධානතම අරමුණක් වන්නේ ග්‍රාහකයා මත කිසියම් බලපෑමක් ඇති කිරීමයි.
    C - සන්නිවේදන ක්‍රියාවලිය තුළ 'සන්නිවේදකයා' හා 'ග්‍රාහකයා' නිශ්චිතව දක්වීම අසීරු ය.
    D - සන්නිවේදනය ගතික ක්‍රියාවලියකි.
    ඉහත ප්‍රකාශ අතුරෙන්
    (1) A හා B පමණක් සත්‍ය වේ.    (2) B හා C පමණක් සත්‍ය වේ.
    (3) C හා D පමණක් සත්‍ය වේ.    (4) A, B, C, හා D යන සියල්ල ම සත්‍ය වේ.

24. ඡායාරූපයක වස්තුව පැහැදිලිව තිබිය දී පසුබිම අපැහැදිලි කිරීමට අවශ්‍ය වී තිබේ. එසේ කිරීමට නම්
    (1) නාභි දුර වැඩි කළ යුතු ය.    (2) ද්වාර වේගය අඩු කළ යුතු ය.
    (3) කාච විවරය වැඩි කළ යුතු ය.    (4) වස්තු දුර අඩු කළ යුතු ය.

25. ප්‍රවෘත්ති වාර්තාකරුවකුගේ භූමිකාවට අදළ **නොවන** ලක්ෂණය ඇතුළත් ප්‍රකාශය තෝරන්න.
    (1) කරුණු පහසුවෙන් වටහා ගත හැකි ඉවක් තිබිය යුතු ය.
    (2) තම දක්මට අදළ ප්‍රවෘත්ති පමණක් වාර්තා කළ යුතු ය.
    (3) සෑම ප්‍රවෘත්තියකට ම පාර්ශ්ව කිහිපයක් තිබෙන බව හඳුනාගත යුතු ය.
    (4) ආචාරධර්මවලට අනුකූලව කටයුතු කළ යුතු ය.

26. දක්ෂ හා ජනප්‍රිය කාටූන් ශිල්පියකු 'දිරිය' පුවත්පතට බඳවා ගැනීමට එහි හිමිකරුවෝ තීරණය කළහ. එවැනි තෝරා ගැනීමකට බෙහෙවින් හේතු විය හැක්කේ
    (1) දක්ෂයකුට එම පුවත්පතේ අවස්ථාවක් ලබා දීමයි.
    (2) ඔහුගේ ජනප්‍රියත්වයෙන් පුවත්පතෙහි අලෙවිය වැඩි කර ගැනීමයි.
    (3) ඔහුගේ අදහස් හා පුවත්පතේ ප්‍රතිපත්ති අතර මනා ගැළපීමයි.
    (4) ඔහුගේ අදහස් ජනතාව වෙත ගමන් කරවීමට මාර්ගයක් සකස් කිරීමයි.

27. මුදල් අයකර පවත්වනු ලබන අධ්‍යාපනික සම්මන්ත්‍රණයක දී ප්‍රකට කතුවරයකුගේ නවකතාවක ඡේද කිහිපයක් ම ඔහුට නොදන්වා උපුටාගෙන තිබිණි. බුද්ධිමය දේපළ පනතට අදළව එසේ සිදු කිරීම
    (1) ආර්ථික අයිතිවාසිකම් කඩ කිරීමකි.    (2) සදචාර අයිතිවාසිකම් කඩ කිරීමකි.
    (3) සාධාරණ ප්‍රයෝජනයට ගැනීමකි.    (4) නිර්මාණ මංකොල්ලයකි.

28. රූපවාහිනී වාණිජ දැන්වීම් සම්බන්ධයෙන් අනිල්, විමල් හා කමල් අතර ඇති වූ සංවාදයකි මේ.
    අනිල් : සමහර දැන්වීම් නිර්මාණාත්මක බවින් හරිම ඉහළයි. ඒත් මිනිසුන්ට කරන්නේ අහිතකර බලපෑමක්. හරිනම් දැන්වීම්වලට ආචාරධර්ම පද්ධතියක් හදන්න ඕනි.
    විමල් : මම නම් දැන්වීම්වලට හරි ආසයි. භාණ්ඩ තෝරාගන්නත් ඒක පහසුවක්නේ.
    කමල් : දැන්වීම් හරිම හානිකරයි. ඒත්, අපිට පුළුවන් ද ඕවා නතර කරන්න.
    මේ අනුව අනිල්, විමල් හා කමල් අයත්වන ග්‍රාහක කණ්ඩායම් අනුපිළිවෙළ කුමක් ද?
    (1) සක්‍රිය, අක්‍රිය හා උදසීන    (2) අක්‍රිය, උදසීන හා සක්‍රිය
    (3) සක්‍රිය, උදසීන හා අක්‍රිය    (4) උදසීන, අක්‍රිය හා සක්‍රිය

[ හතරවැනි පිටුව බලන්න.

29. යන්ත්‍ර සහායක පුද්ගලාන්තර සන්නිවේදනයේ දී (machine assisted interpersonal communication)

A - පණිවිඩය පසුකාලීන අවශ්‍යතා සඳහා සංරක්ෂණය කළ හැකි වේ.

B - පණිවිඩය ලබන ග්‍රාහක ප්‍රමාණය වැඩි වේ.

C - ග්‍රාහකයා සහ සන්නිවේදකයා දුර සහ කාලය මගින් වෙන් කර තැබිය හැකි වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන්

(1) A හා B පමණක් සත්‍ය වේ.
(2) A හා C පමණක් සත්‍ය වේ.
(3) A, B හා C යන සියල්ල ම සත්‍ය වේ.
(4) A, B හා C යන සියල්ල ම අසත්‍ය වේ.

30. සමාජයේ කැපී පෙනෙන පුද්ගලයන්ගේ ජීවන තොරතුරු පාඨක අවධානය බෙහෙවින් දිනා ගන්නා බව පර්යේෂණයකින් හෙළිවිනැ'යි පුවත්පතක සඳහන් විය. ඒ අනුව යමින් එක් විවිත්‍රාංග සහරාවක් ජනප්‍රිය දේශපාලනඥයින්ගේ ළමා කාලය පිළිබඳ විශේෂාංග මාලාවක් පළ කිරීම ආරම්භ කළේ ය. මෙය මාධ්‍ය අන්තර්ගතය

(1) පුවත් විවරයට අනුව සකස් කිරීමකි.
(2) දැන්වීම්කරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා යොදා ගැනීමකි.
(3) ග්‍රාහක අවශ්‍යතා මත තීරණය කිරීමකි.
(4) පාඨක විශ්‍රාන්තිය උදෙසා යොමු කිරීමකි.

31. රූපවාහිනී ප්‍රවෘත්ති පිළිබඳ අදහස් විමසීමක දී මතු වූ කරුණු කිහිපයක් මෙසේ ය.

A - රූපවාහිනී ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීම, ගුවන් විදුලියට වඩා ප්‍රමාද වේ.

B - රූපවාහිනී ප්‍රවෘත්ති තරඟකාරිත්වය මත රඳ පවතී.

C - රූපවාහිනී ප්‍රවෘත්ති පුවත්පතට වඩා විස්තරාත්මක වේ.

D - රූපවාහිනී ප්‍රවෘත්ති සැමවිට ම සජීවීව ඉදිරිපත් කරයි.

මේ අතුරෙන් නිවැරදි ප්‍රකාශ වනුයේ

(1) A, B හා C ය.
(2) A, B හා D ය.
(3) B, C හා D ය.
(4) A, B, C, හා D යන සියල්ල ම ය.

32. පුවත්පතක අන්තර්ගතය තීරණය කිරීම හා සම්බන්ධ **වැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) ප්‍රවෘත්ති හා විශේෂාංග සඳහා ඉඩ වෙන් කිරීමෙන් පසු දැන්වීම් ඇතුළත් කෙරේ.
(2) පුවත්පතක මුල් පිටුව පිළිබඳ සාකච්ඡාවට බොහෝවිට ප්‍රධාන කර්තෘවරයා සහභාගී වේ.
(3) සියලු ම ප්‍රවෘත්ති හා විශේෂාංග, උපකර්තෘවරුන්ගේ සංස්කරණ ක්‍රියාවලියට හසු වේ.
(4) ඡායාරූප තේරීමේ වගකීම පැවරෙන්නේ ඡායාරූප කර්තෘ වෙතයි.

33. ප්‍රවෘත්ති ක්‍රියාවලිය තුළ ප්‍රවෘත්ති ඉදිරිපත් කරන ආකාරය සම්බන්ධයෙන් තීරණ ගැනීමට දායක වන පුද්ගලයන් ගණනාවක් හමු වේ. ඔවුන්

(1) සංස්කාරකවරුන් ය.
(2) නිසි බලධරයන් ය.
(3) දොරටුපාලකයන් ය.
(4) වාර්තාකරුවන් ය.

34. සුළු පරිමාණ මුද්‍රණ කාර්යයක් සඳහා පරිගණක ප්‍රකාශන ක්‍රියාවලිය (DTP) යොදා ගැනීම පිළිබඳ අදහස් කිහිපයක් පහත දක්වේ.

A - ක්ෂණිකව සංශෝධනය කළ හැකි ය.

B - සමතල මුද්‍රණයට සාපේක්ෂව පිරිවැය අඩු ය.

C - කෙටි කලකින් පිටපත් ලබා ගත හැකි ය.

D - නැවත පිටපත් ලබා ගැනීම ඉතා පහසුවෙන් කළ හැකි ය.

මෙම ප්‍රකාශ අතුරෙන්

(1) A, B හා D පමණක් සත්‍ය වේ.
(2) A, C හා D පමණක් සත්‍ය වේ.
(3) B, C හා D පමණක් සත්‍ය වේ.
(4) A, B, C හා D යන සියල්ල ම සත්‍ය වේ.

35. අධ්‍යාපනික පුවත්පතක පාසල් වාර්තාකරු තනතුර සඳහා නිමල් සිය ජීව දත්ත විස්තරයක් ඉදිරිපත් කළේ ය. එහි ඇතුළත් වූ පහත සඳහන් කරුණුවලින් ඊට අදාළ **නොවන්නේ**

(1) එතෙක් ලබාගෙන තිබූ අධ්‍යාපන සුදුසුකම් දක්වීම ය.
(2) පාසල් කාලය තුළ ලබාගත් අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් දක්වීම ය.
(3) සියලු කරුණු විස්තරාත්මකව දක්වීම ය.
(4) ප්‍රධාන මාතෘකා තද කළු අකුරින් දක්වීම ය.

36. ජනමාධ්‍ය, රජය සතුව පැවතීම හා සම්බන්ධ **නොගැළපෙන** ප්‍රකාශය තෝරන්න.

(1) සංවර්ධන ක්‍රියාවලියට අදාළ තොරතුරු වාර්තා කළ හැකි වීම
(2) ජනමතය ගොඩනැංවීමට භාවිත කළ හැකි වීම
(3) දිගු කාලීන ජාතික අපේක්ෂාවන් සමාජගත කිරීමට හැකි වීම
(4) රජයේ පැවැත්ම තහවුරු කර ගැනීමට හැකි වීම

37. ජනසන්නිවේදනයේ දී

A - පොදු පණිවුඩ සමූහයක් විසමජාති ග්‍රාහක සමූහයක් වෙත ඉදිරිපත් කරනු ලබයි.

B - සංකීර්ණ ස්වභාවයක් ගත් ආයතනයක්, යන්ත්‍ර එකක් හෝ කිහිපයක් හෝ යොදා ගෙන විශේෂිත කණ්ඩායමක් වෙත පණිවුඩ සම්ප්‍රේෂණය කරයි.

C - විසිරී පැතිරී සිටින සමජාති කණ්ඩායමක් වෙත කඩිනමින් හා අඛණ්ඩව පණිවිඩ සම්ප්‍රේෂණය කරයි.

ඉහත ප්‍රකාශ අතුරෙන්

(1) A පමණක් සත්‍ය වේ. (2) B පමණක් සත්‍ය වේ.
(3) C පමණක් සත්‍ය වේ. (4) A, B හා C යන සියල්ල ම සත්‍ය වේ.

38. ප්‍රවෘත්ති වාර්තාකරණයේ ගුණාත්මක බව පිළිබඳ ව සැලකිලිමත් වන ජනමාධ්‍යකරුවා සිය නිරන්තර අවධානය යොමු කරන්නේ

(1) කැපී පෙනීම, සවිස්තර බව, අර්ථකථනය හා නිවැරදි බව පිළිබඳ ව ය.
(2) සරල බව, විනිවිද පෙනෙන බව, සත්‍ය බව හා කාලීන බව පිළිබඳ ව ය.
(3) නිවැරදි බව, සමතුලිත බව, පැහැදිලි බව හා විශ්වසනීයත්වය පිළිබඳ ව ය.
(4) ගවේෂණාත්මක බව, ක්ෂණික බව, සම්පූර්ණ බව හා විනෝදස්වාද සම්පාදනය පිළිබඳ ව ය.

39. ජනමාධ්‍ය ආශ්‍රිත ක්‍රියාකාරකම් පිළිබඳ ව ග්‍රාහකයින් ප්‍රතිචාර දක්වන ආකාර කිහිපයක් පහත දක්වේ.

A - ජනමාධ්‍ය අන්තර්ගතය විචාරාත්මකව අගය කරයි.

B - ගෘහස්ථ ජනමාධ්‍ය පාලනයකින් තොරව ප්‍රතික්ෂේප කරයි.

C - ජනමාධ්‍ය ග්‍රාහක සමාජවල නිෂ්ක්‍රිය දයකත්වය ප්‍රතික්ෂේප කරයි.

D - ජනමාධ්‍ය අන්තර්ගතය පිළිබඳ ස්වකීය මතයේ ස්ථිරව එල්බ සිටී.

ඉහත ප්‍රකාශ අතුරෙන් විචාරශීලි ග්‍රාහක ලක්ෂණ වන්නේ

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) C හා D පමණි.

40. ළමයින්, තරුණයින් හා කාන්තාවන් යන පාරිභෝගික කණ්ඩායම් පිළිබඳ ව වාණිජ දැන්වීම්කරණයේ දී වැඩි අවධානයක් යොමු වේ. ළමයින් නමැති පාරිභෝගික කණ්ඩායම සෙසු කණ්ඩායම් දෙකෙන් වෙනස් වීම පිළිබඳ ව අදහස් කිහිපයක් පහත දක්වේ.

A - ළමයින් ආකර්ෂණය කර ගැනීම හා පොළඹවා ගැනීම පහසු කාර්යයකි.

B - ළමයින් ඉලක්ක කර දැන්වීම් ඉදිරිපත් කිරීම ආර්ථික වශයෙන් ලාභදායි වේ.

C - ළමයින් භාණ්ඩ හා සේවා තෝරා ගන්නේ ඔවුන් සතු මිල දී ගැනීමේ හැකියාවට සාපේක්ෂව ය.

D - ළමයාගේ පාරිභෝගික වටිනාකම සම්බන්ධයෙන් ජනමාධ්‍ය අඩු සැලකිල්ලක් දක්වයි.

ඉහත ප්‍රකාශ අතුරෙන්

(1) A හා B පමණක් සත්‍ය වේ. (2) A හා C පමණක් සත්‍ය වේ.
(3) A හා D පමණක් සත්‍ය වේ. (4) B හා C පමණක් සත්‍ය වේ.

※※

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**87 | S | I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I, II
தொடர்பாடல், ஊடகக் கல்வி I, II
Communication & Media Studies I, II

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II

※ **පළමු වන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

※ පළමු වන ප්‍රශ්නයට ලකුණු 20 ක් හිමි වන අතර අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමි වේ.

1. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය හදරන 11 ශ්‍රේණියේ සිසු සිසුවියෝ වාර්ෂික අධ්‍යාපන චාරිකාව පිළිබඳ සාකච්ඡා කරමින් සිටිති. ජනමාධ්‍ය ආයතන කිහිපයක් නැරඹීම ඔවුන්ගේ අපේක්ෂාවයි.

   (i) ජනමාධ්‍ය සතු ලක්ෂණ **දෙකක්** දක්වන්න.

   (ii) ඉහත සාකච්ඡාව අයත් වන සන්නිවේදන වර්ගය කුමක් ද?

   (iii) පළමුව නැරඹිය යුත්තේ මුද්‍රිත ජනමාධ්‍ය බවට තීරණය විය. මුද්‍රිත ජනමාධ්‍ය **දෙකක්** නම් කරන්න.

   (iv) මුද්‍රිත ජනමාධ්‍යවල ඡායාරූප බහුල ලෙස යොදා ගනී. එසේ ඡායාරූප භාවිතයෙන් ග්‍රාහකයාට ලැබෙන ප්‍රයෝජන **දෙකක්** දක්වන්න.

   (v) ශ්‍රව්‍ය ජනමාධ්‍යයක් හා ශ්‍රව්‍ය-දෘශ්‍ය ජනමාධ්‍යයක් නැරඹීමට ද ඔවුහු අපේක්ෂා කරති. ඒ එක් එක් ජනමාධ්‍යයට නිදසුන් **එක** බැගින් සපයන්න.

   (vi) ඉහත එක් එක් විද්‍යුත් ජනමාධ්‍යයේ දී ග්‍රාහකයා හැඳින්වීමට භාවිත කෙරෙන පද **දෙක** වෙන වෙන ම දක්වන්න.

   (vii) ජනමාධ්‍ය ආයතන නැරඹීමේ දී ඒවායේ හිමිකරුවන්ගෙන් අවසර ගත යුතු බවට සාකච්ඡාවේ දී තීරණය විය. ජනමාධ්‍ය හිමිකාරිත්වයේ ප්‍රධාන ආකාර **දෙක** සඳහන් කරන්න.

   (viii) පන්තියේ සිසු සිසුවියන්ගේ දෙමාපියන්ට අධ්‍යයන චාරිකාව පිළිබඳ විස්තරය ලිපියකින් දැන්වීමට තීරණය විය. ඒ සඳහා භාවිත කළ හැකි, අවම පිරිවැයකින් යුත් විද්‍යුත් පිටපත් කිරීමේ ක්‍රමයක් හා විද්‍යුත් **නොවන** පිටපත් කිරීමේ ක්‍රමයක් පිළිවෙළින් නම් කරන්න.

   (ix) පන්තියේ එක් සිසුවියකගේ පියා විදේශ රටක රැකියාවක් කරයි. ඔහු වෙත මෙම තොරතුර ලිඛිතව දැන්විය හැකි කඩිනම් හා අවම පිරිවැයකින් යුත් විධි ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

   (x) අධ්‍යාපන චාරිකාව පිළිබඳ පුවත මීළඟ පාසල් බිත්ති පුවත්පතට ඇතුළත් කිරීමට ළමයින් බලාපොරොත්තු වේ. එම ප්‍රවෘත්තියේ මූල පාඨයෙහි අඩංගු විය යුතු ප්‍රධාන කරුණු **හතරක්** දක්වන්න.

2. "සන්නිවේදනය මූලික මිනිස් අවශ්‍යතාවකි. එසේම මිනිසාට සන්නිවේදනයේ යෙදීමෙන් වැළකී සිටිය නොහැකි ය."

   (i) සන්නිවේදනයෙන් ඔබට සපුරාගත හැකි මූලික අරමුණු **හතරක්** නම් කරන්න.

   (ii) ඔබ, ඔබ සමඟ ම සන්නිවේදනයේ යෙදෙන අවස්ථාවක තොරතුරු ලබා ගැනීම සඳහා භාවිත කළ හැකි නාලිකා **හතරක්** දක්වන්න.

   (iii) පාසල් ශිෂ්‍ය සුබසාධන කමිටුවේ නායකයා ලෙස ඔබව තෝරා පත් කර ගෙන ඇත. එහි දී කෙටි දේශනයක් පැවැත්වීමට ඔබට සිදු වේ. එම අවස්ථාවේ දී ඔබ 'ප්‍රදීපාගාර උපක්‍රමය' යොදා ගන්නා ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

   (iv) ඉහත දේශනයේ දී ඔබ ශරීර භාෂාව (body language) යොදා ගන්නා ආකාර **හතරක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

[ හත්වැනි පිටුව බලන්න.

3. රජයේ එක්තරා කාර්යාලයක කටයුතු සිදු වන ආකාරය විමසා බැලීමේ දී විවිධ තොරතුරු ගණනාවක් නිරීක්ෂණය කිරීමට හැකි විය.

(i) එම කාර්යාලයෙන් යවන සියලු ම ලිපි රාජකාරි ලිපි වේ. රාජකාරි ලිපියක අන්තර්ගතය පිළිබඳ විශේෂිත ම ලක්ෂණය කුමක් ද?

(ii) ලිපි සකස් කිරීම පරිගණකය මගින් පමණක් සිදු කිරීම මෙම කාර්යාලයේ තවත් විශේෂත්වයකි. එසේ ලිපි සකස් කිරීමේ වාසි **හතරක්** සඳහන් කරන්න.

(iii) එම කාර්යාලයේ දක්නට ලැබෙන උපකරණ තුනක් පහත සඳහන් වේ. ඒවා කුමන අවශ්‍යතා මූලික කොටගෙන ප්‍රයෝජනයට ගැනේද'යි කෙටියෙන් පැහැදිලි කරන්න.

(1) ෆැක්ස් යන්ත්‍රය
(2) අංකිත අනු පිටපත් යන්ත්‍රය
(3) ලැමිනේටින් යන්ත්‍රය

(iv) කාර්යාලයේ විවිධ අවශ්‍යතා සඳහා විද්‍යුත් තැපැල භාවිත කරයි. විද්‍යුත් තැපැල භාවිත කිරීමේ වාසි **හතරක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

4. (i) "ශ්‍රී ලංකාවේ සියලු ම ජනමාධ්‍ය එකම වෘත්තීය ආචාරධර්ම පද්ධතියක් ආරක්ෂා කිරීමට බැඳී සිටී."
ඉහත සඳහන් ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරට හේතුව දක්වන්න.

(ii) "ප්‍රවෘත්ති ලෙස ජනමාධ්‍ය මගින් සෑම විට ම ඉදිරිපත් වන්නේ කාලීන හා ප්‍රබල සිදුවීම් ය."
ඉහත සඳහන් ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරට හේතු **දෙකක්** දක්වන්න.

(iii) "අංකිත ඡායාරූප තාක්ෂණය (digital photography) පහසු ක්‍රමවේදයකි."
ඉහත සඳහන් ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරට හේතු **තුනක්** දක්වන්න.

(iv) "පන්ති කාමරය තුළ මාධ්‍ය උපකරණ භාවිතය ඉගෙනුම් ක්‍රියාවලිය සාර්ථක වීමට බලපානු ලැබේ."
මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුර සනාථ කිරීමට හේතු **හතරක්** දක්වන්න.

5. එක්තරා ප්‍රදේශයක සිදු කළ පුරාවිද්‍යා කැණීමක දී ඓතිහාසික වටිනාකමකින් යුත් රන් පතක් මතු විය.

(i) එය පසුදා පුවත්පතක වාර්තා කර තිබිණි. එකී සිදුවීම හා පුවත්පතේ වාර්තාව පළවීම අතර ක්‍රියාවලියට දායක වන වෘත්තිකයින් **හතරදෙනකු** අනුපිළිවෙළින් නම් කරන්න.

(ii) එම සිදුවීම රූපවාහිනී ප්‍රවෘත්ති විකාශනයේ දී ද දැකගත හැකි විය. ඒ සඳහා දායක වූ ප්‍රධාන වෘත්තිකයන් **දෙදෙනකු** නම් කර, එම එක් එක් වෘත්තිකයාගේ කාර්යභාරය වෙන වෙන ම කෙටියෙන් දක්වන්න.

(iii) ඉහත සිදුවීම ආශ්‍රය කර ගනිමින් 'වාර්තා චිත්‍රපටයක්' නිර්මාණය කරනු ලැබී ය. වාර්තා චිත්‍රපටයක් යනු කුමක්ද'යි එහි විශේෂ ලක්ෂණ **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න.

(iv) සිනමාව හා නිශ්චල ඡායාරූප ශිල්පය අතර ඇත්තේ සමීප සම්බන්ධතාවකි. සිනමාකරණයේ දී නිශ්චල ඡායාරූප භාවිත කරනු ලබන අවස්ථා **තුනක්** දක්වා ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

6. දක්ෂ, තරුණ ක්‍රීඩිකාවක් සමාජයේ ඉහළ ප්‍රතිරූපයක් ගොඩනගාගෙන තිබුණි.

(i) 'සමාජ ප්‍රතිරූප' යනු කුමක් ද?

(ii) ඉහත ආකාරයේ ප්‍රතිරූප යොදගෙන විවිධ ව්‍යාපාරික ආයතන වෙළෙඳ දැන්වීම් නිර්මාණය කරයි. එමගින් එකී ආයතන අපේක්ෂා කරන ප්‍රතිලාභ **දෙකක්** නම් කරන්න.

(iii) මෙවැනි සමාජ ප්‍රතිරූප යොදගෙන නිර්මාණය කරනු ලබන වෙළෙඳ දැන්වීම් ළමයින් විෂයෙහි සිදුකරන ධනාත්මක බලපෑම් **දෙකක්** හා ඍණාත්මක බලපෑම් **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

(iv) ඔබ පාසලේ මාධ්‍ය සමාජය ජනමාධ්‍යවලින් සිදු කෙරෙන අහිතකර බලපෑම්වලට එරෙහිව විරෝධය දැක්වීමට අදහස් කරයි. ඒ සඳහා අනුගමනය කළ හැකි ක්‍රමවේද **දෙකක්** විස්තර කරන්න.

7. පහත රූප සටහනේ දැක්වෙන්නේ හැරල් ඩී. ලැස්වෙල් විසින් සන්නිවේදනය පිළිබඳ ව ඉදිරිපත් කළ නිර්වචනයේ අන්තර්ගත ප්‍රධාන අංග යැයි උපකල්පනය කරන්න.

P ⟶ Q ⟶ R ⟶ S ⟶ බලපෑම

(i) රූප සටහනට අනුව P, Q, R සහ S වලින් කවර අංග අදහස් කෙරේද'යි අනුපිළිවෙළින් දක්වන්න.

(ii) පුද්ගලාන්තර සන්නිවේදනයේ දී R ලෙස යොදගත හැකි තාක්ෂණික මෙවලම් **හතරක්** නම් කරන්න.

(iii) ජනසන්නිවේදනයේ දී P ට භාවිත කළ හැකි තොරතුරු මූලාශ්‍ර **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(iv) ශ්‍රව්‍ය ජනමාධ්‍යයක් වන ගුවන්විදුලියට අනුරූපව Q කෙසේ සකස් විය යුතු ද යන්න ප්‍රධාන කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

* * *